කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2018/2019

**INR 2119 : ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය 1977 දක්වා**

කාලය: **පැය දෙකයි (02)**

ඕනෑම ප්‍රශ්න **තුනකට (03)** පිළිතුරු සපයන්න.

1. "ජාත්‍යන්තර පද්ධතියේ හට ගන්නා වෙනස්කම් මෙන්ම පාලන තන්ත්‍රයේ සිදුවන වෙනස්කම් මත ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ වෙනස්වීම හා අඛණ්ඩභාවය පදනම් වන බවට සාක්ෂි ඇත". තුෂ්ණී යුධ සමයේ ශ්‍රී ලංකාවේ දේශපාලන තන්ත්‍ර දෙකක් ඇසුරින් මෙම කියමනේ වලංගුභාවය තක්සේරු කරන්න.

2. "ඩී.එස් සේනානායකගේ විදේශ ප්‍රතිපත්තිය කේන්ද්‍රගත වූයේ රාජ්‍ය සන්නාමකරණය (Nation Branding) වඩා රාජ්‍යයේ ආරක්ෂාව වර්ධනය කිරීම කෙරෙහිය". සාකච්ඡා කරන්න.

3. ප්‍රශ්න **දෙකටම** පිළිතුරු ලියන්න.
   i. 'මධ්‍යස්ථභාවය' (Neutralism) හා 'නොබැඳිභාවය' (Non-alignment) අතර වෙනස පහදන්න.
   ii. "1956 දී සිදුවූ පාලන තන්ත්‍ර වෙනස ශ්‍රී ලංකාවේ බාහිර ප්‍රතිපත්තිය නොබැඳි ලෙස නම් කිරීමට බලපෑවේය". අදහස් දක්වන්න.

4. පහත කරුණු කෙරේ විශේෂ අවධානයක් යොමු කරමින් ඉන්දු-ශ්‍රී ලංකා සම්බන්ධතා පිළිබඳ රචනාවක් ලියන්න.
   - භූදේශපාලනය (Geopolitics)
   - පුරවැසිභාවය පිළිබඳ ගැටලුව
   - සමුද්‍රදේශ සීමා පිළිබඳ අර්බුදය

5. තුෂ්ණී යුධ කාලසීමාවේ දකුණු ආසියානු උප පද්ධතිය තුළ පැවති ගෝලීය ත්‍රිධ්‍රැවීයත්වය (global tri-polarity) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය නිර්ණය කිරීමේදී බලපෑ ආකාරය විවේචනාත්මකව අගයන්න.

6. එක්සත් ජාතික පක්ෂය (UNP) හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (SLFP) ආණ්ඩුවල විදේශ ප්‍රතිපත්තිවල දෘෂ්ටිවාදීමය වෙනස්කම් (ideological difference) විස්තර කරන්න.